# පනාකඩුව තඹ සන්නසින් හෙළිවෙන පළමුවන විජයබාහු රජු

ආර්. පී. ඩී නිපුනි.
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
dharikanipuni2012@gmail.com

**සංක්ෂේපය**

පොළොන්නරුව අගනුවර කරගනිමින් රාජත්වයට පත් වූ පළමුවන විජයබාහු රජතුමාට ලංකා ඉතිහාසයේ හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ළමා කාලයේ සිට ම මලය රට, රුහුණු රට හා රජරට දක්වාම බලය ව්‍යාප්ත කර චෝළ පාලනයෙන් පොළොන්නරුව මුදාගෙන රාජත්වයට පත්වීම දක්වා එතුමා ගෙන ගිය ක්‍රියා කලාපය සුවිශේෂී ය. මොහු රාජත්වයට පත්වීම පිළිබඳව වැදගත් ඓතිහාසික තොරතුරු රැසක් පනාකඩුව තඹ සන්නසින් හෙළිවේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ පළමුවන විජයබාහු රජතුමාගේ රාජත්වය පිළිබඳව පනාකඩුව තඹසන්නසින් හෙළි වන තොරතුරු වංසකතාවලින් හෙළිවන තොරතුරු සමඟ සංසන්දනයයි. මෙහිදී මූලික වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණි. පරසතුරු ආක්‍රමණ ග්‍රහණව තිබූ කාලයක කීර්ති කුමාරයාගේ ආරාක්ෂාව සඳහා මනා ආරක්ෂා කාරී ලෙස කටයුතු කළ "බුදල්නාවන්" හෙවත් බුද්ධරාජ නම් නායකයකු පිළිබඳව ඔහුගේ උපදේශකත්වය යටතේ රුහුණු පාලකයා බවට පත්වීම ද, ඉන් පසුව පොළොන්නරුව චෝළ පාලනයෙන් මුදාගෙන රට එක්සේසත් කිරීම දක්වා ගත කල දුෂ්කර කාල පරිච්ඡේදය පිළිබඳව ද පනාකඩුව තඹ සන්නසින් විස්තර වේ. පනාකඩුව තඹ සන්නසේ අන්තර්ගත තොරතුරු සහ වංසකතාවල තොරතුරු සංසන්දනය කිරීමේ දී යම් යම් වෙනස්කම් ඇති බව අවබෝධ කරගත හැකිය. කෙසේ වෙතත් මේ සියලු මූලාශ්‍රයවල සඳහන් තොරතුරු අනුව පළමුවන විජයබාහු රාජත්වයට පත් වීමට ඉතාමත් දුෂ්කර කාලපරිච්ඡේදයක් පසු කර තිබුණු බව මෙම පර්යේෂණයේදී අනාවරණය කරගත හැකි විය.

**ප්‍රමුඛ පද :- රාජත්වය, පනාකඩුව තඹ සන්නස, මහාවංසය**